# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2022-10-18


පැමිණිලි පාර්ශවය :- කේ.එම්.එස්.රත්නබංඩා මහතා
අංක 164/1,කන්දෙ පිටවල,
හන්තොට අමුණ, මාතලේ.

වගඋත්තර පාර්ශවය :- ප්‍ර.පො.ප.කේ.එස්.දර්සන මයා
පොලිස්ස්ථානය,
පානදුර.

**<u>පැමිණිලි අංකය :- HRC/K/401/19</u>**

**පැමිණිල්ලේ සැළකිරීම -:**

ඉහත නම සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා ලග්ගල පොලිස් බලප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වන බවත්, තමා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රියදුරෙකු ලෙස සේවය කරන බවත්, කිසිදු මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකට වරදකරුවෙකු හෝ සැකකරුවෙකු වී නොමැති බවත්, 2019.08.13 වන දින තමා රාජකාරියට ගොස් සිටියදි තමාගේ නිවසට ලග්ගල පොලිසියේ පොලිස් ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් 05දෙනෙකු පමණ පැමිණ අවු.11 වයසැති තමාගේ පුතාත් නිවසේ සිටි තමාගේ බිරිඳගේ පියාත්, අත්අඩංගුවට ගෙන නිවසේ තිබූ තමාට අයත් යතුරු පැදියේ යතුර ද රැගෙන ගොස් ඇති බව දැන ගැනීමට ලැබුණු බවත්ය. තමා රාත්‍රී 10.00ට පමණ නිවසට පැමිණෙන විට තම දරුවා නිවසට එවා තිබූ බවත්, තමාගේ බිරිඳගේ පියා රිමාන්ඩ් කර ඇති බවත්, නිවසේ කසිප්පු බෝතල් 30 පමණ තිබූ බවට පවසා ඒ සම්බන්ධයෙන් තමාව අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බව ස්ථානාධිපති විසින් ප්‍රකාශ කළ බව දැනගැනීමට ලැබුණු බවත් සඳහන් කර ඇත.

තමාගේ නිවසේ එවැනි නීති විරෝධී අරක්කු කිසිවක් නොතිබුණු බවත්, තමාට විරුද්ධව ස්ථානාධිපති විසින් අසත්‍ය චෝදනා දමා පීඩාවට පත් කිරීමට කටයුතු කරන අතර, ස්ථානාධිපති විසින් මෙම ප්‍රදේශයේ වැලි ජාවාරම් කරන බවට තමා ඊට දින කිහිපයකට පෙර ලග්ගල පොලීසියේ සේවය කරන 57302 හේරත් යන නිලධාරියා සමඟ කළ ප්‍රකාශය නිසා තමාගෙන් පළිගැනීමක් සිදු කළ බව තමා විශ්වාස කරන බවත්, දක්වා ඇත.




| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary: 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996 | වෙබ් / இணையம் / Web: www.hrcsl.lk |

ස්ථානාධිපති විසින් සිදු කරන ලද මෙම ක්‍රියාවන් තමා ඉහළ නිලධාරීන් සමඟ පැවසීම නිසා තමාගේ දරුවාට හිරිහැර කරදර කිරීම සිදුකර අස්ථාන චෝදනා සිදුකර ඇති බවත්, මේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා තමාගේ දරුවාට සිදු වූ අසාධාරණයට සාධාරණයක් ඉටුකර දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-**

මෙම පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවිය ස්ථානාධිපති, ලග්ගල විසින් කොමිෂන් සභාව වෙත වාර්ථාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 2019-08-13 වන දින තමා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව අංක. 164/1, දාස්ගිරිය, හන්තොට අමුණ ලිපිනයේ පිහිටි නිවසක් වැටලීමට ගිය බවත්, එහි නීතිවිරෝධි මත්පැන් පැකට් 02ක් සමඟ අංක.130, දාස්ගිරිය, හන්තොට අමුණ ලිපිනයේ පදිංචි පුවක්ගහ ගෙදර ප්‍රේමදාස යන අය අත්අඩංගුවට ගත් බවත්ය. එහි සිටි උඩුවෙල, නුගගොල්ල ලිපිනයේ පදිංචි ආරියදාස නැමැති තවත් පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු එම අවස්ථාවේ එම නිවසේ සිටි දරුවා වන කේ.එම්.සසික සිතුම්ගේ පියාගේ තාත්තා (සීයා) බව පවසා සිටි නමුත් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකිවීම හේතුවෙන් සැකපිට අත්අඩංගුට ගත් බවත් දක්වා ඇත.

අදාළ නිවසේ කසිප්පු ජාවාරම කරන බවට තමාට තොරතුරක් ලද බවත්, ඒ අනුව එම නිවසේ සිටි කුඩා දරුවෙකුගෙන් කරුණු විමසුවද පලාගිය පුද්ගලයින් කවුරුන්ද යන්න හඳුනාගැනීමට නොහැකි වූ බවත්, නිවසේ වෙනත් වැඩිහිටියෙකු නොසිටි බැවින් ඒ සම්බන්ධයෙන් විමසීමේදි පියා සුරවීර බවත්, මව නිවසේ සිට පොලිසියෙන් පැමිණෙන විට පලාගිය බව පවසා සිටි බවත් දක්වා ඇත. පසුව එම දරුවා සමඟ නිවස පරීක්ෂා කළ අතර ඔවුන්ගේ නිදන කාමරයේ අල්මාරිය තුළින් කසිප්පු ගඳ වහනය වූ බැවින් එය පරික්ෂා කිරීමට අවශ්‍ය බව දන්වා දරුවා මඟින් එහි යතුර අල්මාරිය උඩින් රැගෙන විවෘත කළ අලමාරියේ පොහොර උර දෙකක් තුළ කසිප්පු පැකට් 66ක් අඩංගුව තිබූ බවත්, නිවසේ කිසිවෙකු නොසිටි බැවින් දරුවාගේ ආරක්ෂාව සඳහා තමා විසින් පොලිස්ථානයට රැගෙන ගොස් ප්‍රකාශයක් ලබාගෙන ඒ.එම්.කුසුම්ලතා යන අය දරුවාගේ ආච්චි බව තහවුරු කර ගැනීමෙන් පසු දරුවා භාරදුන් බවත් සඳහන් කර ඇත. අදාළ දරුවා අත්අඩංගුවට ගැනීමක් හෝ හිංසාවට පත් කිරිමක් සිදු නොකළ බවත් වැටලීම සිදුකළ නිවසේ කසිප්පු ජාවාරම දිගින් දිගටම සිදු වන බැවින් නාඳුනන පුද්ගලයින් හා පිටස්තර ප්‍රදේශවලින් පැමිණ පතල් කර්මාන්තයේ යෙදී සිටින අයවලුන්ද පැමිණෙන බැවින්ද දරුවාගේ රැකවරණයට කිසිවෙක් නොසිටි බැවින්ද හා බාල වයස්කාර දරුවකු විවිධ අපචාර වලට ගොදුරු වන බැවින් දරුවාගේ ආරක්ෂාව පතා තම ස්ථානයට රැගෙන පැමිණි බවත්, පසුව දරුවාගේ මිත්තණියට භාර දුන් බවත්, පැමිණිල්ලේ සඳහන් පරිදි දරුවාට කිසිදු හිංසනයක් සිදු කර නොමැති බවත් දක්වා ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතුවලින් අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රියැදුරෙකු ලෙස සේවය කරන අතර සිද්ධිය සිදු වී ඇති දින සේවයේ යෙදී සිට ඇති අතර, වගඋත්තරකාර ලග්ගල පොලිස් ස්ථානාධිපතිවරයා පැමිණිලිකරුගේ නිවසට පැමිණ නිවස පරීක්ෂා කර ඇති බවත්, එම අවස්ථාවේ නිවසේ පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා වන සසිත සිතුම් කෝනාර යන අයත් භාර්යාව වන ඩබ්.ජී.චන්ද්‍රාමාලනි යන අයත්, භාර්යාවගේ පියා වන එච්.ජී.ආරියදාස යන අයත්

පැමිණිලිකරුගේ මව වන ඒ.එම්.කුසුමලතා යන අයත් නිවසේ සිට ඇති බව ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශ මඟින් නිරීක්ෂණය වේ.

නිවස පරීක්ෂා කිරීමෙන් පසු පැමිණිලිකරුගේ දරුවා වන කේ.එම්. සසිත සිතුම් කෝනාර යන දරුවා හා පැමිණිලිකරුගේ මාමණ්ඩිය වන එච්.ජී.ආරියදාස යන අයව අත්අඩංගුවට ගෙන පොලිස්ස්ථානය වෙත රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරුගේ දරුවා පොලිස්ස්ථානය වෙත රැගෙන යාමට හේතුව ලෙස වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, අදාළ නිවස පරීක්ෂා කිරීමේදි නිවසේ සිටි අයවලුන් පලා ගිය බැවින්, දරුවා පමණක් සිටි බැවින් දරුවාගේ ආරක්ෂාව සඳහා පොලිසියට රැගෙන ආ බවයි. එහෙත් එම අවස්ථාවේදී නිවසේ පැමිණිලිකරුගේ මව, භාර්යාව හා භාර්යාවගේ පියා සිටි බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති බැවින් වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා අසත්‍ය කරුණු දැක්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ .

වගඋත්තර පාර්ශවීය වාර්ථාවේ වැඩිදුරටත් සඳහන් වී ඇත්තේ, නිවස පරීක්ෂා කරන අවස්ථාවේදී පලා ගිය සැකකරුවන් සෙවීමට හෝ අත්අඩංගුවට ගැනීමට කිසිදු පියවරක් ගෙන ඇති බව තහවුරු නොවේ .

වගඋත්තර පාර්ශවීය වාර්ථාවේ සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා හැර සෙසු අය පලා ගිය බවයි. නමුත් මවක් තම දරුවන් නිවසේ තනිකර පලායාමක් ප්‍රායෝගිකව සිදුවිය නොහැකි බැවින් එය අසත්‍ය ප්‍රකාශයක් බව පිළිගැනීමට සිදු වේ.

තවද නිවස පරීක්ෂා කිරීමේදී අල්මාරියේ තිබි කසිප්පු පැකට් 66ක් අත්අඩංගුවට ගත්බව සඳහන් වුවද එම භාණ්ඩ අධිකරණයට ඉදිරිපත් කිරීමක් හෝ නඩු පැවරීමක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව එයද අසත්‍ය ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

වගඋත්තර පාර්ශවීය ලග්ගල පොලිස්ථානාධිපතිවරයා පැමිණිලිකරුගේ නිවස පරීක්ෂා කිරීමෙන් පසු නිවසේ සිටි පැමිණිලිකරුගේ දරුවා වන කේ.එම්. සසිත සිතුම් කෝනාර යන දරුවා අත්අඩංගුවට ගෙන පොලිසියට රැගෙන ගොස් පැය කීපයක් පොලිසියේ රඳවා ගැනීමෙන් පසු නිදහස් කිරීම මඟින් අදාළ දරුවාට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති අත්තනෝමතික ලෙස සිරභාරයට පත්නොවීමට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, වගඋත්තරකාර ලග්ගල

හිටපු පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප.-කේ.එස්. දර්ශණ මහතා වෙත මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් තරයේ අවවාද කිරීම සඳහා පොලිස්පති විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.11.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| රෝහිණී මාරසිංහ, | විජිත නානායක්කාර, |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික), | කොමසාරිස්, |
| සභාපතිනී, | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | Dr. Vijitha Nanayakkara<br>Commissioner<br>Human Rights Commission of Sri Lanka |

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂණ අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති, - ඉහත නිර්දේශය පරිදි කටයුතු කිරීමට
පොලිස් මූලස්ථානය, කොළඹ 01

03. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/